**ශීර්ෂය 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 09 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 45.35ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 41.35 ක්උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 4.00 ක් හෙවත් සියයට 8.82 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 36.15 | 35.69 | 0.46 | 1.27 |
| මූලධන | 9.20 | 5.66 | 3.54 | 38.48 |
| **එකතුව** | **45.35** | **41.35** | **4.00** | **8.82** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 25001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 3.50 | 1.35 | 1.00 | 1.60 | 14.00 | 6.84 |

### 2.2.2 වාණිජ නොවන අත්තිකාරම් ගිණුම්

දෙපාර්තමේන්තුවට අදාල වාණිජ නොවන අත්තිකාරම් ගිණුම් දෙකක් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **විෂය අංකය** | **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|---|
| | **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 25002 | 4.00 | 3.93 | 3.00 | 3.11 | 3.50 | 0.92 |
| 25003 | 10.00 | - | 2.50 | 6.54 | 466.00 | 336.10 |

## 2.3 විගණන නිරීක්ෂණය

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

# 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 අධි ප්‍රතිපාදන

වැය විෂයයන් 3 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා උපයෝජනයන් කළ පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 59 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**

විෂය අංක 25001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳව 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ හිඟහිටි ණය ශේෂය රු.297,799 ක් වී තිබුණි.

**3.3 වාණිජ නොවන අත්තිකාරම් ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් ලැබේ.

(අ) විෂය අංක 25003 දරන විවිධ අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණනයේදී අනාවරණය වූ හිඟහිටි ණය ශේෂය රු.336,100,318 ක් වී තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට විවිධ අත්තිකාරම් ගිණුම අනුව ශේෂය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 02 ක පොත් අනුව වූ ශේෂ අතර රු.34,608,230 ක වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල 04 ක් වෙත ලබා දී තිබුණු එකතුව රු.116,738,676 ක අත්තිකාරම් පියවා නොතිබීම නිසා එම අත්තිකාරම් ශේෂ කපා හැරීම සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම අත්තිකාරම් ශේෂ කපා හැරීමට දෙපාර්තමේන්තුව අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**3.4 කාර්යසාධනය**

ගිණුම්කරණ මෘදුකාංගයන්හි වත්කම් කළමනාකරණ මොඩියුලය සංවර්ධනය කිරීම 2015 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළද, එය 2015 වර්ෂය අවසාන කාර්තුවේදී පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

**3.5 මානව සම්පත් කළමනාකරණය**

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 10 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 38 | 28 | 10 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 14 | 09 | 05 |
| | **එකතුව** | **70** | **48** | **22** |